## මොරටුව විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## පුරප්පාඩු

මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. තාක්ෂණික නිලධාරි (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) III ශ්‍රේණිය

අවශ්‍ය සුදුසුකම්

(අ) ඕනෑම විෂය ධාරාවකින් එකවර අ.පො.ස. (උසස් පෙළ) විභාගය විෂයයන් තුනකින් (03) සමත් වී තිබිය යුතුය.

සහ

(ආ) තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්ෂණය/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ හෝ ඊට සමාන ක්ෂේත්‍රයක තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් හෝ පිළිගත් ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකමේ 5 වන මට්ටම (N.V.Q. Level 5) හෝ ඊට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සටහන :-
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති අය සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

වයස : අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

වැටුප් ක්‍රමය : U-MT I (III) රු. 51,095 – 7x540; 10x640 – 60,575 (මාසික)
කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.

බඳවා ගන්නා ක්‍රමය : ලිඛිත සහ / හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.

### 02. මහජන සෞඛ්‍ය පරීක්ෂක (III ශ්‍රේණිය)

අවශ්‍ය සුදුසුකම් : සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂක විභාගය සමත් විය යුතුය.

වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

වැටුප් ක්‍රමය : U-MT I (III) රු. 51,095 – 7x540; 10x640 – 60,575 (මාසික) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.

බඳවා ගන්නා ක්‍රමය : සම්මුඛ පරීක්ෂණයක් මගින්

**03. තාක්ෂණික නිලධාරි (II) ශ්‍රේණිය"ආ" බණ්ඩය**

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | (අ) | අ.පො.ස.(උ.පෙළ) විභාගයෙන් එක් වරකදී විද්‍යා විෂයයන් 03කින් සමත් ව තිබීම. විෂය සංයෝජනය අධ්‍යයනාංශයේ නිර්දේශය මත අදාළ පීඨය විසින් තීරණය කරනු ලැබේ.<br>සහ |
| | (ආ) | තනතුරට අදාල අවම වශයෙන් වසරක පූර්ණකාලීන වෘත්තිය පුහුණු පාඨමාලාවක් සමත්ව තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම. මෙම තනතුර සඳහා පුහුණු පාඨමාලාව හෝ ඒ හා සමාන සුදුසුකම අදාල පීඨයේ පිළිගැනීම මත තීරණය වේ.<br>සටහන :-<br>බඳවාගනු ලබන්නන් අවුරුදු (03) ක පුහුණුවීමේ කාලසීමාවකට යටත්ව "පුහුණුවන තාක්ෂණික නිළධාරී" වශයෙන් පත් කරනු ලැබේ. පුහුණු කාලය තුළදී විද්‍යාගාර කාර්මික කටයුතු සහ එම කාර්යයන්ට අදාලවන භාණ්ඩ ඇණවුම් කිරීම, තොග පොත් පවත්වාගෙන යාම සහ ඉංග්‍රිසි භාෂාවෙන් යතුරු ලිවීම පිළිබඳ ප්‍රවීණත්වයක් ලබා ගත යුතු අතර එකී ප්‍රවීණතාවයන් සපුරන සේවකභවතුන් පුහුණුවීමේ කාලසීමා අවසන් වීමෙන් පසුව තනතුරෙහි තහවුරු කර තාක්ෂණික නිළධාරී II ශ්‍රේණිය "ආ" බණ්ඩය තනතුරට පත් කරනු ලැබේ. |
| වයස | : | අවුරුදු 35ට නොවැඩි විය යුතුය. |
| වැටුප් ක්‍රමය | : | [U-MT I (III)] - රු. 51,095 – 7x540; 10x640 – 60,575 මාසික කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ. |
| බඳවා ගන්නා ක්‍රමය | : | ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි |

**04. රියදුරු (III ශ්‍රේණිය)**

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | 1. | අ.පො.ස (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත් වීම.<br>සහ |
| | 2. | මෝටර් රථ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම සහ එම බලපත්‍රය ලබාගැනීමෙන් පසු අවම වශයෙන් වසර තුනක (03) රියදුරු පළපුරුද්දක් තිබිම . |
| වයස | : | අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. |
| වෙනත් | : | (i) ශ්‍රී ලංකික පුරවැසියකු විය යුතුය.<br>(ii) තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.<br>(iii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.<br>*අයදුම්කරු විසින් මෑතකදී ලබාගත් පොලිස් වාර්තාවක් අයදුම්පත සමඟ ඉදිරිපත් කල යුතුය.* |
| වැටුප් ක්‍රමය | : | U-PL 3 (III) රු. 48,005-16x490-55,845 (මාසික)<br>කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ. |
| බඳවා ගන්නා ක්‍රමය | : | වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |

**05. ට්‍රැක්ටර් ක්‍රියාකරු (III ශ්‍රේණිය)**

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | 1. (i) | අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම හා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ඉහත තනතුරට අදාල ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.<br>හෝ |
| | (ii) | අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම සහ අදාල විෂය ක්ෂේත්‍රයේ වසරක (01) කර්මාන්ත නිපුණතා සහිත සේවා පළපුරුද්ද තිබිය යුතුය. |
| වයස | : | අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. |
| වෙනත් | : | (i) ශ්‍රී ලංකික පුරවැසියකු විය යුතුය.<br>(ii) තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරිරිකව හා මානසිකව සුදුසු විය යුතුය.<br>(iii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.<br><br>*අයදුම්කරු සතුව අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද G1 කාණ්ඩයේ වලංගු රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය.* |
| වැටුප් ක්‍රමය | : | U-PL-2 (III) - රු. 44,575-16x490-52,415 (මාසික)<br>කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ. |
| බඳවා ගන්නා ක්‍රමය | : | වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

සියලුම අයදුම්කරුවන් තම අයදුම්පත් 2026.04.27 දින හෝ ඊට පෙර මාර්ගගත පද්ධතිය හරහා ඉදිරිපත් කළ යුතුය. මාර්ගගත පද්ධතිය හරහා අයදුම්පත් ඉදිපත් කිරිම සඳහා, අයදුම්කරුවන් https://uom.lk/vacancies. වෙබ් අඩවිය වෙත පිවිසිය යුතුය. මාර්ගගත අයදුම්පත් ක්‍රියාවලිය 2026.04.05 දින සිට විවෘත වන අතර 2026.04.27 අවසන් වේ.

සියලුම අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ එක් එක් තනතුරු සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත බාගත කර එම දෘඩ පිටපත (Hard Copies) තමා විසින් සහතික කරන ලද හා සියලුම ඇමුණුම් සමග සහකාර ලේඛකාධිකාරි/ආයතන (අනධ්‍යයන) අංශය, මොරටුව විශ්වවිද්‍යාලය, මොරටුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2026.04.27 දින හෝ ඊට පෙර යොමු කළ යුතුය.

උසස් අධ්‍යාපන ආයතනයන්හි, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් ඉහත පරිදි බාගත කරන තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවීමට කටයුතු කළ යුතු වේ.

ඉහත පරිදි අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවනු නොලබන, ප්‍රමාද වී ලැබෙන, අවශ්‍ය විස්තර සඳහන් නොකළ, අපැහැදිලි හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොමැති හෝ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අවශ්‍ය අයදුම්පත් මාර්ගගත ක්‍රමය මගින් යොමු කිරිමේ දී තාක්ෂණික ගැටළු ඇතිවුවහොත් 011- 2640511 දුරකථන අංකය අමතන්න.අදාළ තනතුරු සඳහා අනුමත කර ඇති බඳවා ගැනීමේ පටිපාටිය අනුව බඳවා ගැනීමේ ක්‍රියාවලිය සහ තේරීම් සිදු කිරිමට විශ්වවිද්‍යාලය සිය අයිතිය රඳවා ගනී.

ලේඛකාධිකාරි,
මොරටුව විශ්වවිද්‍යාලය,
මොරටුව.
2026.03.31